(4)
01704

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

ද්විතීයික හා තෘතීයික අධ්‍යාපන අධ්‍යයනාංශය

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩ සටහන 2018/2019

අවසාන පරීක්ෂණය -2019

**ESP2204/STP8504-** අධ්‍යාපන තාක්ෂණය

කාලය - පැය තුනයි.

---

දිනය -2020.01.26 වේලාව- පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විත වේ. සිසුන් විසින් I වන කොටසේ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුයි. II වන කොටසේ (9 -12) ඕනෑම ප්‍රශ්න (02) දෙකකට ද, III වන කොටසේ (13-16) ඕනෑම ප්‍රශ්න දෙකකට (02) ද පිළිතුරු සැපයිය යුතුය. ප්‍රශ්න 16 අතුරින් පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 12 යි.

පිළිතුරු පත්‍රයේ පළමු පිටුවේ ඉහළ දකුණු කෙළවරින් ඔබ තෝරාගත් විශේෂ විෂයය (තෙවන කොටස සඳහා තෝරාගත් විෂය) නම පැහැදිලිව සඳහන් කරන්න.

## I වන කොටස

**පළමු කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01. පිළිගත හැකි නිර්වචනයක් ඇසුරින් "අධ්‍යාපන තාක්ෂණය" යන පදය ඔබේ වචනයෙන් පැහැදිලි කරන්න.

02. පොදු අරමුණු හා සුවිශේෂී අරමුණු අතර වෙනස දක්වා සුවිශේෂී අරමුණු ලිවීමේ දී ඔබ සලකා බැලිය යුතු තත්ත්ව හතරක් **(04)** සඳහන් කරන්න.

03. "බහු මාධ්‍ය"යන පදය පැහැදිලි කර ගුරුවරයකු ඉගැන්වීම සඳහා බහු මාධ්‍ය අන්තර්ග්‍රහණය කිරීමේ දී සලකා බැලිය යුතු කරුණු තුනක් **(03)** සඳහන් කරන්න.

04. "සමාකරණ ඉගැන්වීම් උපාය මාර්ග" යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කර, සමාකරණය ඵලදායී ලෙස ඔබට යොදාගත හැකි ඉගෙනුම්-ඉගැන්වීම් අවස්ථා දෙකක් **(02)** සඳහන් කරන්න.

05. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා නව තාක්ෂණය අන්තර්ග්‍රහණය කිරීමේ දී ගුරුවරයකු විසින් සලකා බැලිය යුතු කරුණු පහක් **(05)** සඳහන් කරන්න.

06. "ඉගැන්වීම් පද්ධතියක් " යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කර පාසල් හි භාවිත වන ඉගැන්වීම් පද්ධති තුනක් **(03)** නම් කරන්න.

07. "ඩේල්ගේ අත්දැකීම් කේතුවෙන්" නිරූපණය වන පරිදි සංයුක්ත අත්දැකීම් දෙකක් **(02)** හා වියුක්ත අත්දැකීම් දෙකක් **(02)** සඳහා උදාහරණ දක්වන්න.

08. ප්‍රශස්ත ඉගෙනුම් තත්ත්ව (Optimal Learning Conditions) නිර්මාණය සඳහා S.P.A.C.E ආකෘතිය ප්‍රයෝජනවත් වේ. ඉහත ආකෘතියේ අන්තර්ගත ප්‍රශස්ත ඉගෙනුම් තත්ත්ව පහ **(05)** සඳහන් කරන්න.

( ලකුණු 5 X 8 = 40)

## <u>2 වන කොටස</u>

දෙවන කොටසේ තෝරාගත් ඕනෑම ප්‍රශ්න දෙකක් **(02)** සඳහා පමණක් පිළිතුරු සපයන්න.

09. දැනුම සම්ප්‍රේෂණයේ සිට ඉගෙනුම සුසාධ්‍යකරණය දක්වා ගුරුවරයාගේ භූමිකාව වෙනස් වී ඇත.

(i) "දැනුම සම්ප්‍රේෂණය කරන්නකු" ලෙස ගුරුවරයාගේ භූමිකාව තුළ දක්නට ලැබෙන ලක්ෂණ හතරක් **(04)** සඳහන් කර, ඉගෙනුම් සුසාධ්‍ය කරන්නකු ලෙස ගුරු භූමිකාව වෙනස්වන විට ඉහත ලක්ෂණ වෙනස් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) ශිෂ්‍ය කේන්ද්‍රීය ප්‍රවේශය යොදා ගැනීමේ දී ශිෂ්‍යයින්ගේ ඉගෙනුම පිළිබඳ ගුරුවරයා විසින් ගොඩනගා ගත යුතු විශ්වාස පහක් **(05)** සඳහන් කරන්න.

(ලකුණු 05)

(iii) සුදුසු උදාහරණ සපයමින් එම විශ්වාසයන්හි වැදගත්කම විශ්ලේෂණය කරන්න.

(ලකුණු 06)

(මුළු ලකුණු 15)

10. නූතන ලෝකය තුළ අධ්‍යාපන ක්ෂේත්‍රයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය(ICT) ඉතා වැදගත් භූමිකාවක් රඟ දක්වයි.

(i) ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් ඵලදායී කිරීම සඳහා ප්‍රයෝජනවත් වන අන්තර්ජාලයේ ලක්ෂණ හතරක් **(04)** සඳහන් කරන්න. (ලකුණු 04)

(ii) ශිෂ්‍යයින් සමග අන්තර්ජාලය භාවිත කිරීමේ දී ගතයුතු ආරක්ෂිත ක්‍රියාමාර්ග හතරක් **(04)** සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළට නව තාක්ෂණය අන්තර්ග්‍රහණය කිරීමේ දී ඔබට මුහුණදීමට සිදුවිය හැකි බාධාකාරී සාධක හතරක් **(04)** උදාහරණ සමග පැහැදිලි කර ඒවා අවම කර ගැනීමට සුදුසු විසඳුම් යෝජනා කරන්න.(ලකුණු 08)

(මුළු ලකුණු 15)

11. ඉගෙනුම්-ඉගැන්වීම් ආධාරක ඵලදායී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සඳහා ඉතා ප්‍රයෝජනවත් වේ.

(i) ඉගෙනුම් ඉගැන්වීම් ආධාරක තෝරා ගැනීමේදී (අවම වශයෙන් කරුණු හතරක් **04)** සහ සැකසීමේ දී (අවම වශයෙන් කරුණු හතරක් **04)** ඔබ විසින් සලකා බැලිය යුතු වැදගත් කරුණු කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) ඉගෙනුම්-ඉගැන්වීම් ආධාරක පහක් **(05)** නම් කර (පෙළ පොත හැර) එම එක් එක් ආධාරකයේ ඇති සුවිශේෂ වාසියක් බැගින් සඳහන් කරන්න. (ලකුණු 05)

(iii) පන්ති කාමර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා ඉගෙනුම්-ඉගැන්වීම් ආධාරකයක් ලෙස පෙළ පොත ඵලදායීව භාවිත කළ හැක්කේ කෙසේ ද යන්න උදාහරණ තුනක් **(03)** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(මුළු ලකුණු 15)

12. පහත සඳහන් ඕනෑම තුනක් **(03)** පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න.

(i) ඉගැන්වීමේ ශිල්පීය ක්‍රමයක් ලෙස ක්ෂේත්‍ර චාරිකාවල වැදගත්කම.

(II) පන්තිකාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලි තුළ ශිෂ්‍ය කේන්ද්‍රීය ප්‍රවේශය ක්‍රියාත්මක කිරීමේ දී ගුරුවරුන්ට මුහුණ දීමට සිදුවන අභියෝග.

(III) ශ්‍රී ලාංකික පාසල් පද්ධතියට නව්‍ය තොරතුරු තාක්ෂණය මත පදනම් වූ සුහුරු පන්ති කාමර ( ICT Based Smart Classrooms) හඳුන්වා දීම.

(iv) ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී බ්ලූම්ගේ වර්ගීකරණයේ (Bloom's taxonomy ) වැදගත්කම.

(ඉහත එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු 05 බැගින් 5 x 3 = 15)

## <u>තෙවන කොටස - විශේෂ ක්‍රම</u>

තෙවන කොටසේ <u>ඕනෑම ප්‍රශ්න දෙකකට **(02)**</u> ඔබ <u>තෝරාගත් විෂයට අදාළ ව</u> පිළිතුරු සපයන්න. ඔබ තෝරාගත් විෂයය පැහැදිලිව සඳහන් කරන්න.

13. සාර්ථක පාඩමක් ගොඩනැගීම සඳහා ගුරුවරයාගේ පූර්ව සූදානම ඉතා වැදගත් වේ.

(i) ගුරුවරයාගේ පූර්ව සූදානමේ වැදගත්කම පෙන්වීම සඳහා කරුණු හයක් **(06)** සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) පාඩමක් සැලසුම් කිරීමේ දී ගුරුවරයකු විසින් සලකා බැලිය යුතු කරුණු හයක් **(06)** සඳහන් කර ඒවායෙන් තුනක් **(03)** ඔබ උගන්වන විෂයයට අදාළ උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) ඉහත සඳහන් කරන ලද උදාහරණ තුනට **(03)** අදාළව ඔබ අපේක්ෂා කරන අභියෝග විස්තර කර, එම අභියෝග අවම කර ගන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 06)

(මුළු ලකුණු 15)

14. ඔබගේ සිසුන්ට යෝග්‍ය ඉගෙනුම් අත්දැකීම් සැලසුම් කිරීම ඉතා වැදගත් ය.

(i) ඔබ උගන්වන විෂයයෙන් පාඩමක් තෝරාගෙන, එම පාඩම සඳහා යෝග්‍ය චර්යාමය අරමුණු ලියා දක්වන්න.

(අදාළ විෂයය, ශ්‍රේණිය සහ පාඩමේ මාතෘකාවද සඳහන් කරන්න. (ලකුණු 04)

(ii) ඉහත අරමුණු ළඟා කර ගැනීම සඳහා යෝග්‍ය ඉගෙනුම් අත්දැකීමක් සැලසුම් කර විස්තර කරන්න. (එක් එක් අරමුණක් සමඟ ඉගෙනුම් ක්‍රියාකාරකමක් සමපාත විය යුතුයි.) (ලකුණු 05)

(iii) ඉහත සඳහන් කළ අරමුණු අත් කර ගත්තේ දැයි තක්සේරු කිරීම සඳහා සුදුසු ප්‍රතිපෝෂණාත්මක ප්‍රශ්න සහ අවසාන ඇගයීම සඳහන් කරන්න. (ලකුණු 06)

(මුළු ලකුණු 15)

15. “ගැටලු විසඳීම” යනු ඵලදායී ශිෂ්‍ය- කේන්ද්‍රීය ඉගැන්වීමේ ක්‍රමයකි.

(i) “ගැටලු විසඳීමේ ක්‍රමය” යනු කුමක් දැයි කෙටියෙන් පහදන්න. (ලකුණු 03)

(ii) ඔබ උගන්වන විෂයයට අදාළ උදාහරණ ඇසුරින් “උද්ගාමී ක්‍රමය” හා “නිගාමී ක්‍රමය” පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) ගැටලු විසඳීමේ ක්‍රමය භාවිතයෙන් අත් කරගත හැකි සුවිශේෂී අරමුණක් සඳහන් කරන්න. අදාළ පාඩමේ නම හා ශ්‍රේණිය ද සඳහන් කරන්න.

ඉහතින් සඳහන් කළ සුවිශේෂී අරමුණු වෙත ළඟා වීමට ගැටලු විසඳීමේ ක්‍රමය ඵලදායී ලෙස භාවිත කළ හැක්කේ කෙසේ ද යන්න ඔබ උගන්වන විෂයයට අදාළ උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(මුළු ලකුණු 15)

16. නිපුණතා - පාදක විෂයමාලාවක් යටතේ ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුමට අනුබල දීම සඳහා ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම වඩාත් ප්‍රයෝජනවත් වේ.

(i) “නිපුණතා -පාදක විෂයමාලාවක්” යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

(ලකුණු 03)

(ii) ඔබ උගන්වන විෂයයට අදාළව යෝග්‍ය උදාහරණ සපයමින් නිපුණතා පාදක විෂයමාලාවක මූලික ලක්ෂණ හතරක් **(04)** පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම හඳුන්වා දීමේ දී ශිෂ්‍යයින් අතර අන්තර්- පුද්ගල කුසලතා සංවර්ධනය කරන්නේ කෙසේද යන්න ඔබ උගන්වන විෂයයෙන් ලබාගත් අදාළ උදාහරණ දෙකක් **(02)** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 15)

හිමිකම් ඇව්රිණි.